**www.wsws.org** ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරානය-බටහිර බලපෑම් පුලුල් වෙද්දී මැතිවරන ගැටුම් ඉහල නගියි

## Iran: Election clashes mount as West escalates pressure

**බිල් වැන් ඕකන් විසිනි**
**ජූනි 16**

මැතිවරන දූෂන පිලිබඳව විරුද්ධ පක්ෂයේ චෝදනා වලට සමගාමීව, එක්සත් ජනපදය හා බටහිර යුරෝපීය බලවතුන්, පරීක්ෂනයක් පවත්වන ලෙසට කෙරෙන සිය ඉල්ලීම් දැඩිකරද්දී, පසුගිය සතියේ ජනාධිපති මැතිවරන ප්‍රතිපලවලට එරෙහිව ටෙහෙරානයේ වීදිවල ලක්ෂයකට අධික ජනතාව 15 දින පෙලපාලිවලට සම්බන්ධ වූහ.

මෙය ජූනි 12 මැතිවරනයෙන් අනතුරුව ප්‍රතිවාදී ජනාධිපති අපේක්ෂක මීර්හුසේන් මූසාවිගේ ආධාරකරුවන් විසින් දියත් කල කැරලි ගැසීම් ද ඇතුලු විරෝධතා මාලාවේ විශාලතම එක විය. ආන්ඩුව, ආරම්භයේදී ම සියලු පෙලපාලි තහනම් කල ද ආරක්ෂක හමුදා ජනතාව එක් රොක්වීම නතර කිරීමට උත්සාහ නොකලේය.

එය පොදුවේ සාමකාමී ලෙස පැවැත්වුන ද ජනාධිපති මොහමඩ් අහමඩිනිජාඩ්ගේ ආන්ඩුවට පක්ෂපාති බසිජ්ස් නමැති අර්ධ සන්නද්ධ ස්වේච්ඡා හමුදාවක් විසින් ප්‍රයෝජනයට ගත් ගොඩනැඟිල්ලක් පිටත දී හටගත් ගැටුමකින් කැලඹීමට පත් විය. එක් පෙලපාලිකරුවෙකු වෙඩිතැබීමෙන් මියගිය බවත් බොහෝ දෙනෙක් තුවාල ලැබූ බවත් වාර්තා විය. එම අවස්ථාව ඡායාරූප ගතකල අයෙක් මාධ්‍ය ආයතන වෙත පැවසුවේ පෙලපාලිකරුවන් ගොඩනැඟිල්ලට පහරදීමෙන් පසුව වෙඩිතැබීම් සිදුවූ බවයි.

15 දින රාත්‍රියේ විකාශනයවූ දර්ශනවලින් පෙනී ගියේ පෙලපාලිකරුවන් ගොඩනැඟිල්ලට හා එය රැකවල් ලා සිටි භටයන්ට ගල්මුල් ප්‍රහාර එල්ල කිරීමට පිලිතුරු වශයෙන් වෙඩිතැබීම් සිදුවූ බවයි. එයට පිලිතුරු වශයෙන් සෙනඟ ගොඩනැඟිල්ලට ගිනි තැබූහ.

ඊට පෙර දින රාත්‍රියේ ටෙහෙරාන් විශ්වවිද්‍යාලයේ දහස් ගනන් සිසුන් අහමඩිනිජාඩ්ට එල්ල කරමින් ''ආඥාදායකයාට මරනය'' වැනි සටන්පාඨ හඬ නඟමින් පෙලපාලි දැක්වූ අතර, කැරලි මර්දන පොලිසිය සමඟ ගැටුම් හටගත්තේය. සිසුන් පොලිසියට ගල්මුල් ප්‍රහාර එල්ල කල අතර පොලිසිය කඳුලු ගෑස් හා ප්ලාස්ටික් උන්ඩ යොදාගෙන වෙඩිතැබීය.

එසේම 14 වන දින අහමඩිනිජාඩ් අගනුවර මධ්‍යයේ දැවැන්ත ජයග්‍රාහී රැස්වීමක් පැවැත්වීය. බටහිර මාධ්‍යවලින් එයට ලැබුනේ සුලු ප්‍රචාරයක් වුව ද *අයිරිෂ් ටයිම්ස්* වාර්තාකරු මෙසේ පැවසීය. ''මධ්‍යම ටෙහෙරානයේ පැවති ජයග්‍රහනයේ රැලියෙන් අනතුරුව අලුතින් තෝරා පත්කරගත් ජනාධිපති මොහමඩ් අහමඩිනිජාඩ්ගේ ලක්ෂ ගනන් ආධාරකරුවෝ සිය නිවෙස් කරා යමින් සිටි අතරවාරයේ, සමහර දිස්ත්‍රික්කවල පැවතියේ ප්‍රීතිමත් වාතාවරනයකි. ඉරාන අගනුවර, නුවරවල් එකක් නොව දෙකක් ලෙස පෙනී ගියේය.'' දකුනු ටෙහෙරානයේ දුගී ජනාවාස ප්‍රදේශයන්හි ප්‍රීති උත්සව ද නඟරයේ වඩා සමෘද්ධිමත් දකුනු උප නඟරවල මධ්‍යගතවූ විරෝධතාවන් ද වශයෙන් එය සලකුනු විය.

ජූනි 13 මැතිවරනයේ ප්‍රකාශිත ප්‍රතිපල අනුව අහමඩිනිජාඩ්ට ඡන්ද වලින් සියයට 63 ද මූසාවිට සියයට 34 ද හිමි විය. ඡන්ද ප්‍රතිපලය දූෂිත එකක් බවට චෝදනා කල මූසාවිගේ ආධාරකරුවෝ ''කුමන්ත්‍රනයක'' යෙදුනු බවට අහමඩිනිජාඩ් හා ආන්ඩුව හෙලා දුටහ. අහමඩිනිජාඩ් නායකත්වය දුන් පාලන තන්ත්‍රයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ස්වභාවය අනුව ඡන්ද වංචාවක් පැවතීමේ හැකියාව නිසැක වුව ද බටහිර මාධ්‍ය, ප්‍රතිපල ප්‍රෝඩාකාරී යයි විරුද්ධ පක්ෂ එල්ල කල චෝදනා සැලකිය යුතු කිසිදු සාක්ෂියකින් තොරව ම ප්‍රතිරාවය කලහ.

ත්‍රස්තයෙන් තොර හෙට දිනක් සංවිධානයේ සභාපති කෙන් බැලන් හා නව ඇමරිකානු පදනමේ ඇමරිකානු මූලෝපායික සැලසුම් පිලිබඳ පැට්‍රික් ඩෝහාටි මෙසේ ලිවීය. ''ඉරානයේ මැතිවරන ප්‍රතිපල පිලිබිඹු කරන්නේ ඉරාන මහජනතාවගේ කැමැත්ත විය හැකිය.''

ඔවුන් පෙන්වා දුන්නේ මැයි 11 හා 20 දින අතර කාලයේ තමන් පැවැත්වූ ජනමත විමසුම් වලින් ''පෙන්නුම් කලේ අහමඩිනිජාඩ් දෙකට එකක් වශයෙන් සිකුරාදා පැවති මැතිවරනයේදී ඔහු පෙන්නුම්කල සැබෑ සීමාවට බෙහෙවින් වැඩි - ඉදිරියෙන් සිටින බවයි.''

මුසාවිගේ ආධාරකරුවන් ගෙන හැර දක්වන සාවද්‍ය තර්ක දෙකක් ගැන ඔවුහු සඳහන් කරති. එනම් වාර්ගික අසේරියානුවෙක් ලෙස ඔහු අසේරි ඡන්ද වලින් වැඩි ප්‍රමානයක් දිනාගැනීමට අපොහොසත් වීමේ කාරනයෙන් සනාථ වන්නේ සමස්ත ඡන්දය වංචා කර ඇති බවය. එහෙත් මත විමසුමෙන් පෙනී යන්නේ අසේරිවරුන් ද මුසාවිට වඩා අහමඩිනිජාඩ් වෙත දෙකට එකක් වශයෙන් මනාපය දක්වා ඇති බව යයි ඔවුහු කියා සිටිති.

අන්තර්ජාලය පාවිච්චි කරන තරුන ඉරානීයන් අපේක්ෂිත ''ප්‍රතිසංස්කරනයේ'' හදවත වන බවට මාධ්‍ය මඟින් හුවාදක්වනු ලැබුව ද -එන්බීසී මාධ්‍ය ජාලය මෙම විරෝධතාවය ''අන්තර්ජාල පෙරලියක්'' ලෙස හඳුන්වයි - මත විමසුම පෙන්නුම් කලේ ''ඉරාන වැසියන්ගෙන් තුනෙන් එකකටවත් අන්තර්ජාල පහසුකම් සපයාගත නොහැකි බව'' යයි ඔවුහු සඳහන් කරති.

බටහිර මාධ්‍ය විසින් බෙහෙවින්ම නොතකා හැර ඇත්තේ මෙම පන්ති බෙදීම ය. මුසාවිගේ ඊනියා ප්‍රතිසංස්කරන බොහෝ කොටම මාධ්‍ය ගත කොට ඇත්තේ මෙම සාපේක්ෂව වරප්‍රසාදිත හා තුනී සමාජ පදනම මතය. ප්‍රතිසංස්කරන අවශ්‍යයෙන්ම සැදුම් ලද්දේ, අහමඩිනිජාඩ් විසින් වොෂින්ටනය සමඟ සම්බන්ධතා වැඩිදියුනු කර ගැනීමේ මඟක් හෙලිකර ගැනීම සඳහා ද, එක්සත් ජනපදයේ පිටුබලය සහිත සම්බාධක ලිහිල් කර ගැනීම සඳහා මෙන්ම රට විදේශ ප්‍රාග්ධනය සඳහා විවෘත කර ගැනීම සඳහා ද ක්‍රියාවට නැඟූ පුරසාරම් වැඩ සටහනේ සැර බාල කිරීම මුල්කොට ගෙන ය. ඒ සමඟම ඒවා, ''නිදහස් වෙලඳපොල'' ධනවාදය හා කම්කරු පන්තියට මෙන්ම ගම්බද දුගීන් සඳහා වන සමාජ සහන වැඩපිලිවෙලට එරෙහිවීම සමඟ ද අනන්‍යවී තිබේ. එවන් සීමා පැනවීමේ පියවර ඉරාන ජනගහනයෙන් බහුතරයක් සැදුම් ලත් මෙම ස්ථරයන්ගේ ආකර්ශනය දිනාගතහැකි ස්ථම්භයක් බවට පත්වීමේ ඉඩ කඩ බෙහෙවින් අඩු ය.

ඔහුගේ පාර්ශවයෙන් අහමඩිනිජාඩ්, ජනතාවාදී වාචාලකම් සමඟ බැඳුනු ආගමික ශ්‍රද්ධාව වෙත කෙරෙන ආමන්ත්‍රනයේ මෙම වැඩ පිලිවෙලවල්, සිය පාලන තන්ත්‍රයේ මහජන පදනම පවත්වාගැනීම සඳහා ප්‍රයෝජනයට ගනියි.

මැතිවරන ව්‍යාපාරය හා ඉනික්බිති තත්ත්වය පිලිබඳව පවතින අතෘප්තිය වනාහි, ඉරානය තුල ගොඩනැගෙමින් ඇති පන්ති ආතතීන් සේම, ඉස්ලාමීය සමූහාන්ඩුවේ දේශපාලන සංස්ථාපිතය ඇතුලත එන්ට එන්ටම වර්ධනය වන විරසකයන්ගේ විකෘති පිලිබිඹුවකි. මේ දෙඅංශයම එක්සත් ජනපදය හා යුරෝපීය බලවතුන් විසින් යොදන පීඩනය හමුවේ උග්‍ර අතට හැරෙමින් තිබේ.

මැතිවරනයට තරඟ කරන ලද සියල්ලන්, එම දේශපාලන සංස්ථාපිතයේම සාමාජිකයන් වනවාක් මෙන්ම, භාරකාර මන්ඩලයේ පූජකයන්ගේ සුපරීක්ෂාකාරීත්වයට ද හසුවෙයි.

බටහිර මාධ්‍ය විසින් සිංහයෙකු බවට පත්කොට ඇති මුසාවි ''ප්‍රතිසංස්කරනයේ'' ප්‍රමුඛයෙක් වීම සැක සහිත ය. 1981 සිට 1989 දක්වා ඔහු අගමැති තනතුර හෙබවූ කාලය තුල, බොහෝ දෙනෙකු වාමාංශිකයන්වූ දේශපාලන විරුද්ධවාදීන් තොග පිටින් ඝාතනය කල අවස්ථාවන්හි දී මෙන්ම, ඉරාන ජාතිකයන් මිලියනයකට මරු කැඳවූ හෝ තුවාල සිදු කල ඉරාන ඉරාක යුද්ධ අවධියේදී ද, එහි සභාපතිත්වය දරන ලද්දේ ඔහු ය.

මෙම කාලය තුල දැඩි මතධාරියෙක් සේ සලකන ලද ඔහු, ඉරාන මධ්‍යම පංතියට ආමන්ත්‍රනය කිරීමේ දී ප්‍රතිසංස්කරනවාදියෙක් ද නවීකරනවාදියෙක් ද වශයෙන් කරලියට පිවිසියේය. කෙසේ වුව ද ඔහුගේ මැතිවරන ව්‍යාපාරය පිටුපස සිටියේ පූජක සංස්ථාව තුල දක්ෂිනාංශික කොටස් හා විශේෂයෙන්ම ඉරානයේ ධනවත්ම පුද්ගලයා ලෙස සැලකෙන හිටපු ජනාධිපති අලි අක්බාර් හසෙමි රෆ්සන්ජානි වැනි අයයි.

පාලන තන්ත්‍රය තුල මුසාවිට සහයෝගය දුන් කොටස් හා අහමඩිනිජාඩ් යලි බලයට පත්කිරීමට සහාය දුන් අය අතර පැවතියේ උපායික ස්වභාවයේ වෙනස්කම් පමනක් බැවින් විසකුරු බව අතින් ඔවුන් එකිනෙකා අතර වෙනසක් නොමැති තරම් ය. සැලකිල්ලට ගැනුනේ දැවැන්ත මූල්‍ය ආසක්තයන් මෙන්ම වොෂින්ටනය හා අනෙකුත් ප්‍රධාන අධිරාජ්‍යවාදී බලවතුන් සමඟ සම්බන්ධතා වඩාත් හොඳින් ගෙනයන්නේ කෙසේ ද යන කරුනු ය.

මැතිවරනය හා මැතිවරන වංචා පිලිබඳ රාවය, කලාපය තුල මහා බලවතුන්ගේ අවශ්‍යතාවලට වාසිදායක වන පරිදි, ප්‍රතිපත්ති මාරුවක් ඇතිකිරීමේ එල්ලය සහිතව, ඉරානයට එරෙහිව බලපෑම් කිරීමේ ව්‍යාපාරයක් පනගැන්වීම සඳහා ඔවුන් විසින් ප්‍රයෝජනයට ගෙන තිබේ.

ආරම්භයේ දි ඔබාමා පරිපාලනය අර්බුදය සම්බන්ධයෙන් යම් ආකාරයක කල් බැලීමේ පිලිවෙතක් අනුගමනය කල අතර, එය උප ජනාධිපති ජෝසෆ් බිඩෙන්ගේ ප්‍රකාශයෙන් එලි දැක්වුනි. ඉරානය තුල එක්සත් ජනපද ආසක්තයන් ''මැතිවරනයට පෙර මෙන්ම මැතිවරනයෙන් පසුවත් එකම ය.''

කෙසේ වුව ද 15 දින සවස් වන විට එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව මාරුවක් පෙන්නුම් කලේය. එහි ප්‍රකාශකයෙක් මෙසේ පැවසීය. ''ප්‍රචන්ඩ ක්‍රියා, අත්අඩංගුවට ගැනීම් හා විය හැකි ඡන්ද මගඩි පිලිබඳ වාර්තාවලින් අපි බෙහෙවින්ම කනස්සල්ලට පත්ව සිටිමු. අප ඉරාන බලධාරීන්ගෙන් ඉල්ලා සිටින්නේ ජනතාවට සිය අදහස් සාමකාමී ලෙස පලකිරීමට ඇති අයිතියට ගරු කරන ලෙසයි.''

මෙයින් පසුව ජනාධිපති බරක් ඔබාමා විසින් ප්‍රකාශයක් නිකුත් කරන ලදී. ''මා සිතන්නේ ප්‍රජාතන්ත්‍රීය ක්‍රියාවලිය, නිදහස් භාෂනය, ජනතාවට සාමකාමී ලෙස විරුද්ධත්වය පල කිරීමට ඇති ඉඩකඩ යන මේ සියල්ල විශ්වීය වැදගත්කමකින් යුක්ත බවත් එබැවින් ඒවාට ගරු කිරීම අවශ්‍ය බව ය. සාමකාමී ලෙස සිය විරෝධය පලකරන ජනතාව මත ප්‍රචන්ඩත්වය යොදවන බව මට පෙනීයන ඕනෑම අවස්ථාවක හා, ඇමරිකානු ජනතාව ද එය දකින ඕනෑම අවස්ථාවක, ඔවුන් කලබලයට පත්විම නිවැරදි යයි මම සිතමි.'' ඔහු පැවසීය.

1978 හා 79 වසරවල එක්සත් ජනපදයේ පිටුබලය ලත් ෂා රජුගේ හමුදා පෙලපාලි කරුවන් දහස් ගනනින් වෙඩිතබා දමන විට වොෂින්ටනය මෙසේ කනස්සලු වූයේ නොවේ. මෙම ලේ ස්නානයේ උච්ඡතම අවස්ථාවේ එවකට එක්සත් ජනපදයේ ජාතික ආරක්ෂක උපදේශකව සිටි සිබිග්නිව් බ්‍රෙසන්ස්කි, ෂාට පැවසුවේ එක්සත් ජනපදය ඔහුට ''පූර්න සහාය ලබාදෙන බව'' ය. බ්‍රෙසන්ස්කි ඔබාමා පාලනාධිකාරයේ ප්‍රමුඛ විදේශ ප්‍රතිපත්ති උපදේශක ලෙස යලිත් හිස ඔසවා තිබේ.

මේ අතර ජර්මන් චාන්සලර් ඇන්ජිලා මර්කෙල්, පෙලපාලිකරුවන්ට එරෙහිව ''කිසිසේත්ම පිලිගත නොහැකි'' බලය යෙදීම හෙලා දුටුවාය. ''අප කල්පනා කරන්නේ මැතිවරන ප්‍රතිපල පිලිබඳ විනිවිද පෙනෙන අගැයීමක් සිදුවිය යුතු බවයි. ඡන්ද වංචා පිලිබඳ සලකුනු එහි දක්නට ලැබේ.'' යුරෝපා සංගමයේ විදේශ ඇමතිවරු ද මැතිවරන ප්‍රතිපල පිලිබඳව පරීක්ෂන පවත්වන ලෙස ඉරාන බලධාරීන්ගෙන් ඉල්ලා සිටියහ.

15 වන දින ඉරානයේ උත්තරීතර නායක අයතොල්ලා අලි කමේනි නිකුත් කල නිවේදනයේදී ඔහු භාරකාර මන්ඩලයට උපදෙස් දී ඇත්තේ ඡන්ද දූෂන චෝදනා පිලිබඳව පරීක්ෂන පවත්වන ලෙසයි. එහි එල්ලය වන්නේ අධිරාජ්‍යවාදී බලවතුන්ගේ මෙම බලපෑම් අඩුම තරමින් හැකිතාක් දුරට හෝ සමහන් කරන අතර ම ඉරානය තුල ම නැගී ඇති ආතතීන් අවමකර ගැනීමයි.

මෙම බලපෑම්, වසර 30 කට පෙර ෂාට අවි ආයුධ හා සහයෝගය ලබා දෙමින් ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කලාට කිසිසේත් දෙවෙනි වන්නේ නැත. එක්සත් ජනපද හා අවශේෂ බටහිර බලවතුන්ගේ අරමුන වනාහි, කලාපය තුල සිය මුලෝපායික ආසක්තයන් පෙරට ගෙනයාමෙහිලා ඉරානය මුලුමනින්ම ග්‍රහනයට ගැනීමත් එරට ඇති දැවැන්ත බලශක්ති සම්පත් පරිපූර්නව සූරාකෑමත් ය.

.

.

.

© www.wsws.org